# ජා-ඇල නගර සභාව
# ගම්පහ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ඔක්තෝබර් 25 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ජා-ඇල නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ලැබූ එක්වන් මුදල් රු.800,000 ක් ලැබිය යුතු මුදල් ගිණුමට බැර කිරීම වෙනුවට හිඟ කඩකුලී ගිණුමට බැර කර තිබුණි.

(ආ) ලැබිය යුතු වාණිජ පරිශ්‍ර කුලියට දීමේ ගාස්තු රු.223,459 ක් වුවත්, රු.777,140 ක බැර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ලැබිය යුතු පොදු වෙළඳපල කුලී රු.1,576,898 ක් වුවත්, රු.329,121 ක බැර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්
--------------------------------------

2013 ජූනි 31 දින වන විට විගණන විමසුම් 19 කට පිළිතරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
-----------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.76,100,915 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්
----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාලව ශේෂයන්ගේ එකතුව රු.42,828,903 ක් වු අතර, ඒවාට අදාළ උපයෝගී ලේඛණ හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු43,309,115.ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.122,457 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 183,700 ක් විය.

2.2 බැංකු ගිණුම්
----------------

(අ) මහජන බැංකු ජංගම ගිණුමක දෛනිකව රුපියල් මිලියන 04 කට අධික මුදලක් වර්ෂය පුරාම රඳවා ගෙන තිබුණ අතර, ඒවා පොලී ආදායමක් ලබා ගත හැකි වන පරිදි ස්ථාවර තැන්පතු වල අයෝජනය කිරිමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ලංකා බැංකු ජංගම ගිණුමක රු.580,530 ක ශේෂයක් 2011 අප්‍රේල් මාසයේ සිට නිශ්කාර්යව තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i.) | වරිපනම් හා බදු | 14,455 | 13,891 | 16,274 |
| (ii.) | බදු කුලී | 11,605 | 8,785 | (777) |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 376 | 337 | 121 |
| (iv.) | වෙනත් ආදායම් | 29,012 | 15,292 | 2,763 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු අගය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වරිපනම් 4% ක්ද, බදුකුලී 24% ක්ද, බලපත්‍ර ගාස්තු 10% ක් හා වෙනත් ආදායම් 47% කින් අඩුවී ඇති බව නිරීක්ෂණය වේ.

(ආ) බදුකුලී ආදායම් අයවිය යුතු මුදල රු.223,459 ක් වුවත්, ගිණුම්වල රු.777,000 ක බැර ශේෂයක් ලෙස දැක්විණි.

### 2.3.2 වරිපනම් බදු

දේපල තහනම් කිරීමේ නිලධාරීන් විසින් හිඟ වරිපනම් බදු එකතු කිරීමේ ප්‍රගතිය ඉතාම අවම මට්ටමක විය. හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 170(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 ව්‍යාපාර බදු ආදායම එකතු කිරීම

2012 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු සඳහා අයදුම්පත් බෙදාහැරීම හා එම අයදුම්පත් ආපසු එකතු කිරීම පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. අයදුම්පත් බෙදාහැරීම ආදායම් පරීක්ෂකවරුන් මගින් සිදුකළද, බෙදාහැර ඇති අයදුම්පත් සංඛ්‍යාව හා ඒවා ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි කිසිවක් පවත්වා නොතිබුණි.

2.3.4 වෙළඳ බලපත්‍ර ගාස්තු
--------------------------

2012 වර්ෂයට අදාලව වෙළඳ බලපත්‍ර ලේඛණවල ලැබූ බලපත්‍ර ආදායම් පමණක් සටහන් කරන අතර, ලැබිය යුතු බලපත්‍ර ආදායම් පිළිබඳ ලේඛණගත කිරීමක් කර නොතිබුණි. නගර සභා බල ප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන හා බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාරික ස්ථාන පිළිබඳ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 දූෂ්‍ය අක්‍රමිකතා
----------------------

සභාවේ නිලධාරීන් තිදෙනෙකු විසින් ව්‍යාජ ලෙස ලියවිලි සකස් කර සේවකයන් හයදෙනෙකුගේ නමින් රු.1,060,700 ක මුදලක් ආපදා ණය ලෙස ලබාගෙන තිබුණි.
මේ පිළිබඳ කරන ලද විගණන පරීක්ෂණයෙන් පසු ණය මුදල් ආපසු ගෙවා තිබූ අතර, ඊට අදාල පොලිය අයකරගෙන නොතිබුණි. තවද මෙම නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු පරිදි කටයුතු කර නොතිබූ අතර, දෙදෙනෙකු ස්ථාන මාරුවීම් ලබාගෙන ගොස් තිබුණි.

2.5 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය
---------------------------------

2008 ජුලි 30 දිනැති අංක 1560/6 දරන ගැසට් නිවේදනයේ පළකර ඇති 2008 අංක 01 දරණ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති" සියළුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළයුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති අංක එල්ජීඩී/05/08/පොදු/වෙළුම හා පළාත් පාලන කොමසාරිස්, (බස්නාහිර පළාත) ලිපියෙන් දැනුම් දී තිබුනද, නගර සභාව ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මේ සඳහා ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර, වියදම ලෙස රු.10,797,000 ක ඇස්තමේන්තුවක් තිබුණි. මේ හේතුවෙන් පහත පරිදි ලැබිය යුතු ආදායමක් නගර සභාවට ලැබී නොතිබුණි.

(අ) රීති මාලාවේ අංක 18(1) අනුව අදාළ පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව, කසල දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා එහි 1 උපලේඛණයේ ඇති භාවිත ගාස්තුව නගර සභාව අයකර නොතිබුණි.

(ආ) රීති අංක 09 අනුව නගර සභාව එහි 3 උපලේඛණයේ දැක්වෙන පරිදි අපද්‍රව්‍ය ප්‍රමාණය මත ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) රීති අංක 20 අනුව ඉදිකිරීම් අපද්‍රව්‍ය කැබලි හා සුන්බුන් එකතු කිරීම් සඳහා ද අයකල යුතු ගාස්තු කිසිවක් අයකර නොතිබුණි.

(ඈ) ඒ අනුව රීති අංක 21 හි ඇති $ස්ථාන දඩ" අයකර නොතිබුණි.

---

(ඉ) රීති අංක 22 ට අනුව ඝන අපද්‍රව්‍ය ආදායමෙන් 20% ක ප්‍රමාණයක් අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ අරමුදලට බැරකර නොතිබුණි.

(ඊ) මෙම රීති මාලාවේ 54 රීතියට අනුව අපද්‍රව්‍ය ප්‍රවාහනය කරන රියදුරන් ඒ පිළිබඳ වාර්තා තබාගෙන ලේකම් වෙත භාරදීමක් සිදුවී නොතිබුණි.

2.6 කාර්ය සාධනය

------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාර් සැලසුම අනුව නගර සභාවේ කාර්ය සාධනය පිළිබඳ පහත සඳහන් කරුණු අනාවරණය විය.

ක්‍රියාකාර් සැලසුම අනුව ඉටුකිරීමට සැලසුම් කර තිබූ පහත සඳහන් කටයුතු ඉටුකර නොතිබුණි.

(i) ජා-ඇල නගර සභා භූමියේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති මාතෘ සායන ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු නිමකිරීම හා ජනතා අයිතියට පැවරීම.

(ii) ඌරුවල් ඔය පැතිබැම්ම ඉදිකිරීමේ කටයුතු.

(iii) නගර සභා 70 වන සංවත්සරය වෙනුවෙන් නගර සභා ආරම්භයේ සිට ජීවත්ව සිටින සභාපතිතුමන්ලා සහ මන්ත්‍රීවරුන් වෙනුවෙන්ද, කාර්ය මණ්ඩලය සඳහාද සිහිවටන, සමරු තිළිණ ප්‍රදානය කිරීම හා නගර සභාව තුළ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.

(iv) දෙවන පිවිතුරුපුර වැඩසටහන යටතේ වැලිගම්පිටිය ග්‍රාමනිලධාරී වසම ක්‍රියාත්මක නොකිරීම.

2.7 සංයුක්ත සැලැස්ම

--------------------

2003 ජුනි 02 දින හා අංක පීඑෆ්/12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ජේදය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 05 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය